යම් පුවතකට සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී ලෙසින් සහ ලුහුඬින් සිරස්තල යෙදීමට ඇති අවශ්‍යතාවය පිළිගත හැකි කරුණකි. නමුත්, එහිදී එම සිරස්තලය මගින් ප්‍රවෘත්තියට අදාළ සිදුවීම පාඨකයා නොමග යැවීමකින් තොරව සහ සිදුවීම සැහැල්ලු කොට දැක්වීමකින් තොරව ඉදිරිපත් විය යුතු නොවේද?

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, ලිංගික අපරාධ වැනි කරුණු ඉදිරිපත් කිරීමේදී, එම අපරාධයේ බරපතලකම සිරස්තලය තුළින්ද පිළිබිඹු නොවන විටකදී පවා, එවැනි අපරාධයන් හි නිසි බරපතලකම සමාජගත වනු ඇතැයි ඔබ සිතන්නේද?

ඒ අනුව, එකම පුවතක් ඉදිරිපත් කෙරෙනා පහත සිරස්තල දෙකින් ඔබ තෝරාගන්නේ කුමන සිරස්තලයද?

1) අසමජ්ජාති කපුවා තරුණියකට බලු වැඩක් කරලා
2) දාසයේ තරුණියට අතවර කළ කපුවා රිමාන්ඩ්

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Lankadeepa**